# බලය පිළිබඳ සාහිත්‍යයික කියවීමක් (එළුඅත්තනගලු වංසය ඇසුරින්)

**පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි**[1]

බලය පිළිබඳ ඉතා වැදගත් විග්‍රහයක් 14වන සියවසෙහි රචිත සිංහල සාහිත්‍ය කෘතියක් වන එළුඅත්තනගලු වංසයෙන් අනාවරණය වෙයි.

පාලි හත්ථවනගල්ලවිහාරවංශය නමැති කෘතියේ සිංහල පරිවර්තනයක් වන මෙහි සිරිසඟබෝ රජුගේ වංශ කථාව දිග හැරෙයි. මෙම වංශ කථාව විමසා බලන විට එහි "බලය" පිළිබඳ ඉතා අගනා විග්‍රහයක් ඇතුළත්ව තිබීම බොහෝ විචාරකයන්ගේ අවධානයට යොමු නොවූ කරුණකි.

මෙම කථා පුවතෙහි සඳහන් පහත සිදුවීම් ඔස්සේ රාජ්‍ය බලය පිළිබඳ ඓතිහාසික මෙන්ම ප්‍රබල සමාජ විග්‍රහයක් ද විවරණය කළ හැකි වෙයි. සංඝතිස්ස, සංඝබෝධි, ගෝඨාභය ක්ෂත්‍රිය කුමාරවරුන් තිදෙනා තිසාවැව පාලම මතින් ගමන් කරද්දී පාසටහන් ඇසූ අන්ධ බමුණෙකු කළ අනාවැකිය, සංඝතිස්ස රජුගේ මරණය තුළ ජනතාවට පීඩාකාරී ලෙස බලය යෙදූ පාලකයෙකුට අත්වන ඉරණම, සංඝබෝධි කුමාරයාට බලය ලබා දීමට සංඝයා සතුව තිබූ බලය, සංඝබෝධි කුමාරයාගේ දේශනය. බලය පුද්ගලයා අගතිගාමී කෙරෙන අයුරු විග්‍රහ කිරීම, සංඝබෝධි රජුගේ රාජ්‍ය විචාරය තුළ මතු වූ අර්බුද ආධ්‍යාත්මිකව ජය ගැනීම, ගෝඨාභයගේ කුමන්ත්‍රණ හමුමේ යුධකාමී නොවී පලායාම, ගෝඨාභයගේ බලය හමුවේ කෙරෙන මනුෂ්‍ය ඝාතන, සිරිසඟබෝ බලය හමුවේ කරන ආධ්‍යාත්මික දානය යනාදී මෙම කරුණු පාදක කර ගනිමින් බලය පිළිබඳ සාහිත්‍යයික විමර්ශනයක් එළුඅත්තනගලු වංසය ආශ්‍රයෙන් ඉදිරිපත් කෙරේ.

**ප්‍රමුඛ පදඃ** සම්භාව්‍ය සාහිත්‍යය, සාහිත්‍ය විචාරය, එළුඅත්තනගලු වංසය

**Title:** An analysis of power in *Elu Attanagalu Vamsaya*

**Keywords:** Classical literature, literary criticism, Elu Attanagalu Vamsaya

[1] සිංහල අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ
ඊමේල්: sirisumanathero@yahoo.com